# වත්මන් අර්බුදයේ දුටු නුදුටු පැති

**ඉතින් අපි යෝජනා කරපු වැඩපිළිවෙළ තුළ සටන් විරාම ගිවිසුම අහෝසි කළ යුතුයැයි සඳහන් කිරීම අති ධාවනකාරීත් නැහැ, වැරදිත් නැහැ නේද? අපේ මධ්‍යම කමිටුව අනුමත කළ පරිදි අපි මහින්ද රාජපක්ෂ මහතා සමඟ ආණ්ඩුවේ කොටස්කාරයකුවීම සඳහා කතා කළා. ඒ සඳහා නිවැරදි වැඩපිළිවෙළක් ඉදිරිපත් කළා. ආණ්ඩුව සමඟ එක්ව කටයුතුකිරීම අපි මඟ හැරියා යැයි යමෙක් කියයි නම් ඔහු බොරු කාරයෙක් විතරක් නෙවෙයි, ඔහු ජනවරමටපයින් ගහලා එක්සත් ජාතික පක්ෂ නායකයන්ට ඇමතිකම් පිරිනැමූ මහින්ද රාජපක්ෂ මහතාට එල්ලවෙන පිළිකුල සහ අප්‍රසාදයයෙන් රාජපක්ෂ මහතා ගලවා ගන්න නිවට උත්සාහයක් දරන කෙනෙක්ද වෙනවා.**

*පසුගිය කලාපය හා සම්බන්ධයි*

අනික් අතට පසුගිය කාලයේ එක්සත් ජාතික පක්ෂය පරාජය කිරීමට සැබෑවටම කටයුතු කළේ කවුද? ඒ, ජනතා විමුක්ති පෙරමුණේ අපි. 2001 දෙසැම්බර් බලයට ආපු එක්සත් ජාතික පක්ෂය 2002 පෙබරවාරි සටන් විරාම ගිවිසුම අත්සන් කරලා කොටින්ට වෙනම පාලනයක් ලබාදීමට කටයුතු කරනවිට, රිගේනින් ශ්‍රී ලංකා' වැඩපිළිවෙළ පිළිඅරගෙන ජාතිකසම්පත් විදේශිකයන්ට විකිණීමට පියවර ගන්න කොට එය වහාම නැවැත්වීම සඳහා මහ පාරට බැහැලා, උද්ඝෝෂණය කරලා, පා ගමන් ගිහිල්ල, සන්ධානය ගොඩනගල එක්සත් ජාතික පක්ෂය පරාජය කිරීමට සමත් ජනතා බලයක් හැදුවෙ අපි. ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ඒ කාලේ හිටියෙ පැරදිලා. කඩාවැටිල. අපි 2004 සන්ධානය හදනකොටමහින්ද රාජපක්ෂ මහත්තයා ඊට විරුද්ධව එක්සත් ජාතික පක්ෂය සමඟ අනියමින් පෙළ ගැහිලයි හිටියේ. 2004අපි ශ්‍රී ලංකා නිදහස් පක්ෂය සමඟ සන්ධානය ගොඩනගලා ඉක්මන් මහමැතිවරණයක්

අරගෙන එක්සත් ජාතික පක්ෂ පරාජය කිරීමට මුල්ව කටයුතු කළා. අපි සන්ධානය හදන්න මැදිහත් වනවිටත් චන්ද්‍රිකා කුමාරණතුංග ජනාධිපතිය එක්සත් ජාතික පක්ෂය සමඟ සාකච්ඡා කරමිනුයි හිටියෙ.ඔබට මතක ඇති මනෝ-මලික් සාකච්ඡා ගැන. ඒව පරාජය කරල තමයි, අපි 2004 එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව පරාජය කරලා සන්ධාන අණ්ඩුව හැදුවේ. ඒ වගේම 2006 ජනාධිපතිවරණයේදී අපට බරපතල ගැටලු රැසක් තිබියදී පවා අපි මහින්ද රාජපක්ෂ මහතාට උදව් කිරීමට කටයුතු කළේ, එක්සත් ජාතික පක්ෂ නායකයා ජනාධිපතිවීම වැළැක්විය යුතු වූ නිසයි. එදා අපි එසේ කටයුතු නොකළා නම් අද මහින්ද රාජපක්ෂ මහතා මේ රටේ ජනාධිපති වෙන්නේ නැහැ. ඉතිං එහෙම එක්සත් ජාතික පක්ෂ ප්‍රතිපත්ති පැරදවීමට කටයුතු කරපු, ඒ වගේම 2007 නොවැම්බර් පාර්ලිමේන්තුවේ අයවැය පිළිබඳ ඡන්ද විමසීමේදී, එක්සත් ජාතික පක්ෂයට අනියමින් හෝ සහය නොදීමට කටයුතු කරපු අපට එ.ජා.ප. හිතවාදී යැයි කියන්න පුළුවන් දේශපාලන කුහකයින්ට හා තක්කඩින්ට පමණයි. අනෙක් අතට කොටි සංවිධානය ගැන බලන්න. අපි කොටින්ට උදව් කරාවි කියල සිහිබුද්ධිය තියෙන කවුරුත් පිළිගන්නවාද? අපේ රටේ ප්‍රධාන දේශපාලන පක්ෂ අතර කොටි සංවිධානය සමඟ ගනුදෙනු නොකළ, සාකච්ඡා නොකළ හා ගිවිසුම් නොගැසූ එකම දේශපාලන පක්ෂය ජනතා විමුක්ති පෙරමුණ පමණයි. කොටි සමඟ ගිවිසුම් ගහපු හකීම් මහත්තයා, තොණ්ඩමන් මහත්තයා මේ ආණ්ඩුව ඇතුලේ තියං හිටියනේද? ඒ කාලේ සමහරුහකීම් හා තොණ්ඩමන් මහත්වරු දේශප්‍රේමීන් ලෙස නම් කිරීමට තරම් දුරදිගගියා. ඒ දේශපාලන අවස්ථාවාදයේ තරම තමයි. එලෙස කටයුතු කරන අය තමයි, කොටින්ට අනියමින් උදව් කරන බවට ජනතා විමුක්ති පෙරමුණට ඇඟිල්ල දිගු කරන්නේ.

ජනතා විමුක්ති පෙරමුණේ ඉතිහාසය දෙස බලන්න. පසුගිය කාලෙ කොටි පැරදවීම සඳහා අපි ගත්ත ක්‍රියාමාර්ග නිසා නේද අද මේ තරම් බරපතල මට්ටමකට කොටි දුර්වල කරන්න පුළුවන් වෙලා තියෙන්නේ. අපි මෑත කාලෙ උදාහරණ කිහිපයක් කියන්නම්. 2002 පෙබරවාරිරනිල් - ප්‍රභා ගිවිසුම" අත්සන් කරලා රට බෙදීමේ දිශාවට යනවිට සන්ධානය හදලා, එක්සත් ජාතික පක්ෂය පරදවලා, සටන්විරාම ගිවිසුම අහෝසි වන තැනට දේශපාලනය පෙළ ගැස්සුවේ කවුද? ජනතා විමුක්ති පෙරමුණේ අපි.ඒ වගේම හිටපු ජනාධිපතිනි චන්ද්‍රිකා කුමාරණතුංග මහත්මිය සුනාමි සහන මණ්ඩලය හරහා උතුරු නැගෙනහිර පරිපාලන කටයුතු කොටින්ට පවරන්න කටයුතු කරන විට ඊට විරෝධය පා ඇමතිකම් 04ක් අතහැර සන්ධාන ආණ්ඩුවෙන් එළියට බැස්සෙ අපි නේද? අද මහ ලොකුවට කොටි විරෝධීන් ලෙස පෙන්වන්න හදන සමහර අය ඇමති ධූරය වෙනුවෙන් සුනාමි සහන මණ්ඩලය පිළිගත්තා. මෛත්‍රීපාල සිරිසේන ඇමතිතුමා ඒ කාලෙ එක්තරා පුවත්පතකට කියලා තිබුණ ඒඅයට ආණ්ඩුවට වඩා සුනාමි සහන මණ්ඩලය වටින බව. එතුමා බලයට හා තනතුරට කෑදරකමින් සුනාමි සහන මණ්ඩලය අගය කරද්දී ඊට එරෙහිව තනතුරු අතහැරලා එළියට ඇවිල්ලා අධිකරණය ඉදිරියට ගිහින් සුනාමි සහන මණ්ඩලය අහෝසි කරවලා ප්‍රභාකරන්ට වාසි ලැබීම නැවැත්තුවේ අපි. ඒ වගේම ඊනියා සාම ක්‍රියාවලියෙන් නෝර්වේ ඉවත් කෙරෙව්වේ අපි. ඒ වගේම 1987 දී ජයවර්ධන ජනාධිපතිතුමා විසින්ඉන්දු -ලංකා ගිවිසුමට අනුව උතුරට බලෙන් ඈඳා තිබූ නැගෙනහිර පළාත අධිකරණ නියෝගයක් මගින් යළි වෙන්කරවා ගෙන කොටි සංවිධානයේ නිජබිම් සංකල්පය පරාජය කළේ අපියි.

උතුරු පළාතෙන් නැගෙනහිර පළාත වෙන් කරන ලෙස අපි මහින්ද රාජපක්ෂ ජනාධිපති තුමාට යෝජනාකළාම ඔහු එය ප්‍රතික්ෂේප කළා. ඒව අමතක කළ යුතු නැහැ. ඒ විතරක් නෙවෙයි කොටි පැරදවීමේ යුද්ධය සඳහා ආණ්ඩුවට බලකරලා ජනතාවගේ මතය සකස් කිරීමටත්, සන්නද්ධ හමුදාවල මානසිකත්වය ඉහළ නැංවීමටත් කටයුතු කරලා සාකච්ඡා උගුලේ හිරවෙන්න ගිය ආණ්ඩුව සටන් මඟට ගත්තේ, අපේ බලපෑම හරහායි. ඉතිං කොටි සංවිධානයත්, බෙදුම්වාදයත් පැරදවීමට මේ තරම් දේවල් කරපු ජනතා විමුක්ති පෙරමුණ කොටින්ට අනියමින් හෝ සහය දෙන බව කියන්න පුළුවන් කාටද? ඒ දේශපාලන ඔල්මාද කාරයින්ට නැත්නම් තක්කඩියන්ට විතරයි.

අනෙක් අතට ඔය බංකොලොත් අවලාදය අලුත් දෙයකුත් නෙවෙයි. පරණ අවලාදයක්. දැන් ඔය අවලාදය මතුරන අය ඕක අරගෙන තියෙන්නෙ එක්සත් ජාතික පක්ෂයෙන්. 1983 බොරුචෝදනා මත අපේ පක්ෂය තහනම් කරපු ජේ. ආර්. ජයවර්ධන මහත්තයාගෙ එක්සත් ජාතිකපක්ෂ ආණ්ඩුව ඉන්පසු අපි කොටින් සමඟ සම්බන්ධයි කියල අවලාද නැඟුවා. රෝහණ විජේවීර සහෝදරයා සැඟවී සිටින්නේ, තමිල්නාඩුවේ ඊළම්වාදීන්ගෙ කඳවුරක කියලා සිතියමකුත් එක්ක ඒ දිනවල සමහර පුවත්පත්වල පල කළා. පසුව රෝහණ විජේවීර සහෝදරයා උලපනේදී අත්අඩංගුවට ගත්විට ඉහත බොරුව අතේ පත්තු වුණා. එදා ජේ. ආර්. ජයවර්ධනමහත්තයා පතුරුවපු මේ අවලාදය දැන් අපිම දිනවපු රාජපක්ෂ ආණ්ඩුවත් රාජපක්ෂ ආණ්ඩුවට බැලමෙහෙවරකම් කරන මාධ්‍ය හා සමහර කල්ලිත් යළි පුනරුච්චාරණය කළාට සිහිබුද්ධිය තිබෙන ජනයා මේවා පිළිග න්නේ නැහැ. අනෙක් අතට මේ අවලාදවලින් ආණ්ඩුවබලාපොරොත්තු වන වෙනත් කරුණක් තියෙනවා. ඒ, මේ අවලාදවලට බයවෙලා අපි ආණ්ඩුවේ ජනතා විරෝධී කටයුතුවලට එරෙහි අපේ විවේචනය, උද්ඝෝෂණය නතර කරාවි කියලයි.නැහැ මොන හේතුවක් නිසාවත් මේ ආණ්ඩුවේ වැරදිවලට එරෙහිව ජනතාවත්, රටත් වෙනුවෙන් අපි කරන උද්ඝෝෂණය හා අරගලය අපි නතර කරන්නෙ නැහැ.මේ ආණ්ඩුවට විරුද්ධව එක්සත් ජාතික පක්ෂය සමඟ හෝ කොටි සමඟ එකට වැඩකරන්න අපට අවශ්‍ය නැහැ. ඒ සඳහා සැබෑ ලෙසම දේශප්‍රේමී හා ප්‍රගතිශීලී ජනතා බලවේගවල සහය අපට ලැබෙනවා. ඒ බලවේග සමඟ එක්ව මේ සමස්ත ප්‍රතිගාමීත්වය පරාජය කිරීමට අපි කටයුතු කරනවා.

ප්‍රශ්නය :- වත්මන් ආණ්ඩුවට එක් වී රට හැදීමේ කාර්යය ඔබ මඟහැර ගොස් ඇති බවට මතයක් තිබෙනවා. ආණ්ඩුව සමඟ එක්ව කටයුතු කිරීමට ඔබ කටයුතු නොකළේ ඇයි?

සෝමවංශ අමරසිංහ සහෝදරයා: ජනාධිපතිවරණය ජය ගත්තාට පස්සෙ මහින්ද රාජපක්ෂ මහතා තම ආණ්ඩුවට එක් වී ඇමති ධූර භාරගන්නා ලෙස ජනතා විමුක්ති පෙරමුණේ අපට ආරාධනාකළා. ඒ ආරාධනය පිළිබඳව අපේ මධ්‍යම කාරක සභාව සාකච්ඡා කළා. ජනාධිපතිවරණයට කලින් සැප්තැම්බර් මාසේ 08 වැනිදා ජනතා විමුක්ති පෙරමුණ මහින්ද රාජපක්ෂ මහතා සමඟ අත්සන් කළ ගිවිසුමට අනුව නම් අපි ඒ මහතාගේ ආණ්ඩුවට එකතුවී ඇමතිධූර භාරගන්නා බවට ඒ ගිවිසුමේ වගන්තියක් නැහැ. එහෙම වගන්තියක් නැතුව තිබියදී තමයි පක්ෂයේ මධ්‍යම කාරක සභාව මහින්ද රාජපක්ෂ මහතාගෙ ඉල්ලීම පිළිබඳ සාකච්ඡාවක් ආරම්භ කළේ. අපේ මධ්‍යම කාරක සභාවේ මේ ගැනසාකච්ඡා කරන්නත් කලින් මහින්ද රාජපක්ෂ මහතා තමන්ගේ ඇමති මණ්ඩලය නම් කළා. ඒ නව

ඇමති මණ්ඩලය දිවුරුම්දීම කෙරෙන අවස්ථාවෙදි ඒ ගැන අපට දැනුම් දෙනවිට අපේ මධ්‍යමකාරක සභාව රැස්වෙලා තිබුණා. ඒක ඉතාම හදිසි දැනුම්දීමක්. මමත්, අනුර දිසානායක සහෝදරයාත් මධ්‍යම කාරක සභාවට සහභාග වෙමින් සිටියෙදීම තමයි, ඇමති මණ්ඩලය දිවුරුම්දීමේ අවස්ථාවට ගියේ. අපි දෙන්නටම එවැනි උත්සවයකට අඳින්න තරම් සුදුසු ඇඳුම්පවා තිබුණේ නැහැ. ඇමති මණ්ඩලය දිවුරුම්දීම එකම අවුල් ජාලයක් බවට පත් වී තිබුණා.සමහර ඇමතිවරුන්ගේ නම් වරද්දලා තිබුණා. සමහර ඇමතිවරුන්ගෙ අමාත්‍යංශ වරද්දලා. සමහර නම් ප්‍රකාශයට පත් කරනවා. එය වැරදීමක් යැයි නැවත ප්‍රකාශ කරනවා.අමාත්‍යංශවිෂයයන් දෙකට තුනට කඩලා. ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතාගේ ඇමති මණ්ඩලය දිවුරුම්දීම දෙස බලාසිටි ඕනෑම කෙනෙකුට විශේෂයෙන්ම ඒ මහතා ජයග්‍රහණය කරවීම පිණිස වෙහෙසමහන්සි වූ අයට ලොකු කණගාටුවක් ඇති වෙන්න ඕනෑ. ඇමති මණ්ඩලය සීමා කළ යුතුව තිබුණත් සිදුවූයේ, ඒකෙ අනික් පැත්ත. කෙසේ හෝ වේවා, ජනතා විමුක්ති පෙරමුණ ඇමති මණ්ඩලයට එකතුවීම හෝ නොවීම පිළිබඳව තීන්දුකිරීමට කලින් කඩිමුඩියේම ඇමති මණ්ඩලය පත් කිරීමට මහින්ද රාජපක්ෂ මහතා පියවර ගත්තේ කුමක් නිසාද යන්න පසුව ඒ මහතා කළ ප්‍රකාශවලින්ම පැහැදිලි වුණා. සුවිශාල ඇමති මණ්ඩලයපත්කර ගත්තාට පසුවත් මහින්ද රාජපක්ෂ මහතා සිය ඇමති මණ්ඩලයට එක්වන ලෙස ජනතා විමුක්ති පෙරමුණට ආරාධනා කළා. ඒ ආරාධනය පිළිග න්නේ ද? ප්‍රතික්ෂේප කරන්නේද? යන තීරණයට එළඹීම සඳහා අපේ පක්ෂයේ මධ්‍යම කාරක සභාව ආරම්භ කළ සංවාදය දිගින් දිගටම සිදුවුණා.

ඒ සංවාදයේදී ජනතා විමුක්ති පෙරමුණ ආණ්ඩුවට එකතු විය යුතු බවටත්, එහෙත් එසේ එකතු විය යුත්තේ ශ්‍රී ලංකාවේ ස්වෛරීභාවය, ස්වාධීනත්වය, භෞමික අඛණ්ඩතාවය යළි අත්පත් කරගැනීමත් ජාතික ආර්ථිකය ආරක්ෂා කර ගනිමින් රටට අත්‍යවශ්‍ය ආර්ථික වර්ධනයක් අත්පත් කරගැනීමත් ඉලක්ක කරගත් වැඩපිළිවෙළක් සඳහා පමණක් බවටත් මධ්‍යම කාරක සභාව ඒකමතිකව තීරණය කළා. ඒ තීරණය මත පිහිටලා අපි ජනාධිපතිවරයා ප්‍රමුඛ ශ්‍රී ලංකා නිදහස් පක්ෂය සමඟ සාකච්ඡා ආරම්භ කළා. ආණ්ඩුවට එකතුවීමට නම් ජනතා විමුක්ති පෙරමුණ ආණ්ඩුවට එකතු වූ පසු ක්‍රියාත්මක කරන්නට අදහස් කරන වැඩපිළිවෙළ කුමක්දැයි අපි සාකච්ඡාවේ මුලදීම ප්‍රශ්න කළා. එතකොට මහින්දරාජපක්ෂ මහතා අපට කීවේ, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට වැඩපිළිවෙළක් ලියන්න හැකියාවක් නැහැ. ඒ නිසා ඔබතුමාලම වැඩපිළිවෙළක් ලියන්න. ඒක සාකච්ඡාවට ගනිමු කියලයි. ඒ අනුව අපි විසි වැදෑරුම් වැඩපිළිවෙළ ලිව්වා. ඒක 2006 ජුලි 31 දා අපි ජනාධිපතිතුමා ඇතුළු ශ්‍රී ලංකා නිදහස් පක්ෂ නායකයන්ට භාර දුන්නා.

ඒ විසි වැදෑරුම් වැඩපිළිවෙළ පිළිබඳව සාකච්ඡාව දිගින් දිගටම ඇදුණා. ඒ අතරතුරදි ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මධ්‍යම කාරක සභාව යැයි හැඳින්වනු කිහිප දෙනෙක් මහින්ද රාජපක්ෂ විසින් කැඳවනු ලැබුවා. එහිදී ජනතා විමුක්ති පෙරමුණ ආණ්ඩුවට එකතු කරගත්තොත් මට ඕන කරන පනත්පාර්ලිමේන්තුවේ සම්මත කරවා ගන්න බැරිවේවි යන ප්‍රකාශය මහින්ද රාජපක්ෂ මහතා කළා. මෙය මට මතක විදිහට රූපවාහිනියේ විකාශනය වුණා. මම හිතන්නෙ මහින්ද රාජපක්ෂ මහතාගේ කටින් ඇත්ත තත්ත්වය එළියට පැන්නා කියලයි. ඒ බව රූපවාහිනියේ අය තේරුම් ගන්න ඇති. අදත් ඒ කොටස විකාශනය කළොත්මහින්ද රාජපක්ෂ මහතා ජනතා විමුක්ති පෙරමුණ පිළිබඳව දක්වන සැබෑ ආකල්පයත්, එක්සත් ජාතික පක්ෂයේ කණ්ඩායමක් ආණ්ඩුව ඇතුළට අරගෙන ඔවුන්ට ඇමතිධූර පිරිනමන්න හේතු වුණේ ජනතා විමුක්ති පෙරමුණ ආණ්ඩුවට එකතු නොවුණ නිසාත්ය කියන බොරුවත් හෙළිදරව් වෙනවා.

අපි මේ ප්‍රකාශයන් නොසලකා මහින්ද රාජපක්ෂ මහතා සමඟ දිගටම සාකච්ඡා කළා. සුපුරුදු පරිදිම ශ්‍රී ලංකා නිදහස් පක්ෂය සාකච්ඡා තේරුමක් නැතිව දිග්ගස්සන්න යනකොට අපි එසේ නොකරන ලෙසශ්‍රී ලංකා නිදහස් පක්ෂයට බලකර සිටියා. මෙන්න මේ අතරතුරදී තමයි, රාජපක්ෂ මහතා ආණ්ඩුව සමඟ වැඩකිරීම සඳහා එක්සත් ජාතික පක්ෂය සමඟ සාකච්ඡාවක් ඇරඹීමට ආරාධනය කරමින් එක්සත් ජාතික පක්ෂ නියෝජ්‍ය නායක කරූ ජයසූරිය මහතාට ලිපියක් යැව්වේ. ඒක සදාචාර විරෝධී වැඩක්. ජනතා විමුක්ති පෙරමුණ එක්ක එක සාකච්ඡාවක් සිදු කෙරෙමින් තිබියදීම එක්සත් ජාතික පක්ෂයට සාකච්ඡාවට ආරාධනය කරන්නෙ කොහොමද? මේ තත්ත්වය තුළ අපි අපේ වැඩපිළිවෙළ පිළිබඳ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ අදහස අපට ලබාදෙන්නැයි බල කළා. ඒ නිසා ශ්‍රී ලංකා නිදහස් පක්ෂය අපට අපේ යෝජිත ක්‍රියාකාරී වැඩපිළිවෙළ පිළිබඳ පිළිතුරක් එව්වා.

අපේ වැඩපිළිවෙළත්, එයට ශ්‍රී ලංකා නිදහස් පක්ෂය දුන් පිළිතුරත්, ඊට අපි ලබාදුන් පිළිතුරත් අපි ජනතාව හමුවේ තිබ්බා. අවශ්‍ය නම් නැවතත් ජනතාවට ඉදිරිපත් කරන්න අපි ඕනෑම විටක සූදානම්. ශ්‍රී ලංකා නිදහස් පක්ෂය අපට දුන්න පිළිතුරත් පැහැදිලි එකක් නෙවෙයි. පොදු ජන එක්සත් පෙරමුණේත්, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේත් දියාරු බව, වැනෙන සුළු බව, අරමුණක් නැතිකම, ඒ පිළිතුර මඟින් පැහැදිලි වුණා. ඊනියා සටන් විරාම ගිවිසුමඅහෝසි කළ යුතු යැයි අපි අපේ ගිවිසුම මඟින් යෝජනා කළා. එය ප්‍රතික්ෂේප කළ ආණ්ඩුව කියා සිටියේ සටන් විරාම ගිවිසුම අහෝසි කළහොත් ජාත්‍යන්තර ප්‍රජාව ලංකාවට එරෙහි යුද්ධ ප්‍රකාශ කරාවි කියලයි. නමුත් පසුව මොකද වුණේ? අප යෝජනා කළ දේ කළහැකි බව හොඳ හැටි ඔප්පු වුණා. පසුගිය අයවැය යෝජනාව දෙවන වර කියවා තිබියදී පාර්ලිමේන්තුවේ ඡන්ද විමසීමට පෙර සටන් විරාම ගිවිසුම අහෝසි කළා. මොකක්ද රටට සිදුවුණ නරක? මොකවත් නැහැ. ඉතින් අපි යෝජනා කරපු වැඩපිළිවෙළ තුළ සටන් විරාම ගිවිසුම අහෝසි කළ යුතුයැයි සඳහන් කිරීම අති ධාවනකාරීත් නැහැ, වැරදිත් නැහැ

32 වන පිටුවට

**ජනතා විමුක්ති පෙරමුණ,**
**ජාත්‍යන්තර අංශය,**
**ඔස්ට්‍රේලියාව**